විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මාළිගාවත්ත ලේකම් කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No. විවැ/චක්‍රලේඛ/2009 දිනය / திகதி / Date 2009- 12- 18

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 10/2009 (සංශෝධන 1)**

ත්‍රිවිධ හමුදාපතිවරුන්/
දිසා ලේකම්වරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන්.

**සන්නද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා සාමාජික සාමාජිකාවන්**
**වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකවීම**

ශීර්ෂගත කරුණට අදාලව මවිසින් නිකුත් කරන ලද 10/ 2009 හා 2009- 05- 14 දිනැති විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛයට ඌනපුරකයක් ලෙස මෙම චක්‍රලේඛය නිකුත් කරමි.

මේ වන විටත් සිවිල් වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි වී ඇති රාජ්‍ය නිලධාරීන් ස්වේච්ඡා බලසේනාවන්හි නියුක්ත වූ විට දායක මුදල් අයකළ යුත්තේ ඔවුන් ලබන ඉහල වැටුපෙනි. එනම් රාජ්‍ය සේවයේ හෝ සන්නද්ධ හමුදා වැටුප් යන දෙකෙන් වැඩි වැටුපෙනි. එසේම ඔවුන් ස්වේච්ඡා බලසේනාවට බැඳුනු දින සිට එම දායක මුදල් අයකළ යුතුය. (දායක මුදලේ වෙනස/ හිඟ දායක මුදල්) ඒ අනුව අය කළ යුතු හිඟ දායක මුදලක් වෙතොත් නිලධාරියා විශ්‍රාම ලැබූ විට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයෙන් හෝ විශ්‍රාම වැටුපෙන් අය කළ යුතුය. නිලධාරියා මියගොස් ඇති විට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රදානයෙන් අදාල හිඟ දායක මුදල අය කළ යුතුය. වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සකස් කිරීමේදී දායකයා ලැබූ වැඩි වැටුප පදනම් කොට ගත යුතුය.

ඉහත සඳහන් තත්වය යටතේ යම් නිලධාරියෙකු මියගිය පසු කලත්‍රයා වෙත වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් සකස් කිරීමේදී නිලධාරියාට අදාල හමුදා වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ගොනුව මෙම දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුය. ඉන් අනතුරුව අදාල නිලධාරියාට හිමි සිවිල් වැන්දඹු / වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ගොනුව හා ඒකාබද්ධ කොට මා විසින් අදාල ප්‍රාදේශීය ලේකම් වෙත යැවීමට කටයුතු කරනු ලැබේ.

10/ 2009 චක්‍රලේඛයේ සඳහන් අනෙකුත් කරුණු ඒ අයුරින්ම ක්‍රියාත්මක වේ.

(අත්සන)
කේ. ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. ලේකම් - රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය
5. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
6. විගනකාධිපති


| | Telephone | Fax | | Telephone | Fax | | Telephone |
|---|---|---|---|---|---|---|---|
| Director General | 2431647 | 2342078 | W&OP | 2332346 | 2432214 | Policy | 2329580 |
| Director | 2432008 | 2342078 | PSPF | 2324375 | 2332347 | Forces | 2320439 |
| Director (F) | 2434974 | 2391403 | L.G.U. | 2342525 | 2342525 | Computation | 2434414 |
| Internal Auditor | 2329634 | 2329634 | Registration | 2329178 | - | Payments | 2431612 |

E-mail: pensions@sltnet.lk
Web site: www.pensions.gov.lk